# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

No 17A, Pedris Road, Colombo 3, Tel: **011 3010662-4**, Fax: **011 2577117**
**E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org


## පාර්ලිමේන්තු මහ මැතිවරණය 2015

## විශේෂ මාධ්‍ය නිවේදනය

**2015 ජූලි 31 වන දින ශ්‍රී ලංකාව, කොළඹ**

අද දින පෙ.ව. 11.30ට පමණ කොටහේන ශාන්ත බෙනඩික් විද්‍යාලයයේ ක්‍රීඩා පිටිය ඉදිරිපිට බ්ලූමැන්ඩල් පාරේදී වෙඩි තැබීමක් සිදු වී ඇති බවට වාර්තා විය. කොළඹ දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක රවී කරුණානායක මහතා සිය ආධාරකරුවන් සමඟ ගෙයින් ගෙට ගොස් ප්‍රචාරක කටයුතුවල නිරතව සිටියදී මෙම වෙඩි තැබීම සිදු වී ඇති බවට එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන කාර්යාලයේ ප්‍රචාරක කළමණාකාර රජිව් සෙනෙවිරත්න මහතා මැ.ප්‍ර.නි.ම ට පැවසීය. වෙඩි තැබීම සිදු වූ ස්ථානයේ ආධාරකරුවන් 500ක් පමණ සිටිය බවට වාර්තා විය. වෙඩි තැබීමෙන් එක් කාන්තාවක් මිය ගිය බවටද 12 දෙනෙකු තුවාල ලබා රෝහල් ගත කර ඇති බවටද ඉන් 05 දෙනෙකු බරපතල තත්ත්වයෙන් හදිසි ප්‍රතිකාර ඒකකයේ සිටින බවට මැ.ප්‍ර.නි.ම ට තහවුරු විය.

මියගිය කාන්තාව මාදම්පිටිය කොළඹ 15 පදිංචි එස්. මහීමා නැමති එ.ජා.ප ආධාරකාරණියක් බව වාර්තා වේ. සැකකරුවන් පිරිස අංක තහඩු නොමැති කළු පැහැති හයිබ්‍රිඩ් වර්ගයේ මෝටර් රථ දෙකකින් පැමිණ ඇති අතර ඔවුන් කළු පැහැති ඇඳුමෙන් සැරසී සිට ඇත. වෙඩි තැබීම විනාඩි 10ක පමණ කාලයක් සිදු වූ බවට වාර්තා විය. පොලිස් ආරංචි මාර්ග වලට අනුව හිස් පතරොම් කොපු 16ක් වෙඩි තැබීම සිදු වූ ස්ථානයෙන් සොයාගෙන ඇත

මැ.ප්‍ර.නි.ම. වර්ෂ 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංධානය එක්ව ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණයන්හි ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණයට ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට මැ.ප්‍ර.නි.ම. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් සහ මානව හිමිකම් දත්ත කේන්ද්‍රයෙන් (INFORM) සමන්විත වේ.

මැ.ප්‍ර.නි.ම. සියලු වාර්තා සහ මාධ්‍ය නිවේදන www.cmev.org වෙතින් ලබා ගත හැකිය.

ආචාර්ය පී. සරවනමුත්තු
සම කැඳවුම්කරු